110

පළාත් පාලන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත)
உள்ளூராட்சி திணைக்களம் (மேல் மாகாணம்)
DEPARTMENT OF LOCAL GOVERNMENT (WESTERN PROVINCE)

අපගේ දැක්ම :- "යහ පාලනයෙන් සපිරි ඵලදායී පළාත් පාලන සේවාවක්"

| | | |
|---|---|---|
| ...ලක்கம் LGD/02/21/03/ 106 | ඔබේ අංකය உமது இலக்கம் Your No. | දිනය திகதி Date 2013.12.4 |

05 DEC 2013

...ගරික කොමසාරිස්,
...කොළඹ මහා නගර සභාව.

**...ස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය.**

...ස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවාව සඳහා වන ව්‍යවස්ථා සංග්‍රහය ...රු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති බව පළාත් පාලන ලේකම් (බ.ප) ගේ අංක:සීඑම්/ඩබ්පී/ඊ3/13-16 ... 2013.11.15 දිනැති ලිපියෙන් මා වෙත දන්වා ඇත.

02. ඒ අනුව එම ව්‍යවස්ථා සංග්‍රහයේ ඡායා පිටපතක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවන බව කාරුණිකව ...න්වමි.

...න්ද්‍රානි සමරකෝන්,
...ළාත් පාලන කොමසාරිස්,
...ස්නාහිර පළාත.

6/12

2013/12/10

| | |
|---|---|
| ...ලිපිනය / முகவரி / Address | අංක.02, කේම්බ්‍රිජ් ටෙරසය, කොළඹ 07. / இல.02, கேம்பிறிஜ் டெரஸ், கொழும்பு 07. / No.02, Cambridge Terrace, Colombo 07. |

| ... | ප්‍ර.කාර්යාලය | පාලන අංශය හා මානව සම්පත් අංශය | නීති අංශය | සැලසුම් අංශය | ගිණුම් අංශය | විමර්ශන අංශය | ඉංජිනේරු අංශය | ප්‍රජා සංවර්ධන අංශය |
|---|---|---|---|---|---|---|---|---|

# බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය

බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් .................... දින අනුමත කරන ලද බස්නාහිර පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය

01. නාමය : මෙම ව්‍යවස්ථා සංග්‍රහය බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය ලෙස හඳුන්වනු ලැබේ.

02. අර්ථ නිරූපන :

02.1 **"ව්‍යවස්ථා සංග්‍රහය"** යන පදයෙන් අදහස් කරනුයේ බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය වේ.

02.2 **"ආණ්ඩුකාරවර"** යනුවෙන් අදහස් කරනුයේ ගරු බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයා වේ.

02.3 **"කොමිෂන් සභාව"** යනුවෙන් අදහස් කරනුයේ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවය.

02.4 **"ලේකම්"** යනුවෙන් අදහස් කරනුයේ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වේ.

02.5 **"ප්‍රධාන ලේකම්"** යනුවෙන් අදහස් කරනුයේ බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් වේ.

02.6 **"සේවාව"** යනුවෙන් අදහස් කරනුයේ බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවාව වේ.

02.7 **"සතුටුදායක සේවා කාලය"** යනුවෙන් අදහස් කරනුයේ උසස් වීම් සඳහා ඉල්ලුම් කරන දිනට පූර්වාසන්න සේවා කාලය තුළ යෙදුන සියලුම වැටුප් වර්ධක ලබා ඇත්තා වූ ද , ඒ කාලය තුළ කළ වරදකට ( අවවාද කිරීමක් හෝ තදින් අවවාද කිරීමක් හැර) දඬුවමක් ලබා නැත්තා වූද සේවා කාලයකි.

02.8 **"සක්‍රිය සේවා කාලය"** යනුවෙන් අදහස් කරනුයේ ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

03. බලපැවැත්වීම :

03.1 මෙම ව්‍යවස්ථා සංග්‍රහය බස්නාහිර පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයට බඳවා ගනු ලබන හෝ අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන් විෂයෙහි බල පැවැත්විය යුතුය. බස්නාහිර පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවාවට අයත්වන තනතුරු හා ඒවා ශ්‍රේණිගත කිරීම 1 උපලේඛනයේ දක්වා ඇති ආකාරයට විය යුතුය.

03.2 බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපන කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව / බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.

04. ක්‍රියාත්මක වන දිනය :

මෙම ව්‍යවස්ථා සංග්‍රහය ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

05. පාලනය :

05.01 සේවාව ,බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමයන්ට යටත්වේ.

අනුමත කරමි / ~~නොකරමි~~.

2013/10/24

දිනය

06. ව්‍යුහය හා සේවක සංඛ්‍යාව :

06.1

(අ) විධායක මට්ටම
1 පන්තිය I ශ්‍රේණිය
1 පන්තිය II ශ්‍රේණිය
1 පන්තිය III ශ්‍රේණිය

(ආ) තෘතීය මට්ටම
2 පන්තිය I ශ්‍රේණිය
2 පන්තිය II ශ්‍රේණිය

(ඇ) ද්විතීය මට්ටම
3 පන්තිය I ශ්‍රේණිය
3 පන්තිය II ශ්‍රේණිය
3 පන්තිය III ශ්‍රේණිය

06.2 මෙම පන්තිවලට අයත්වන තනතුරු 1 උපලේඛනයේ දැක්වේ.

06.3 ඒ ඒ පන්තියේ අනුමත තනතුරු සංඛ්‍යාව පළාතේ සේවා අවශ්‍යතාව අනුව බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගේ එකඟතාවය මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් තීරණය කරනු ඇත .

06.4 එක් එක් පන්තියක් තුළ ඇති ශ්‍රේණිවල තනතුරු සංඛ්‍යාව ඒකාබද්ධ සේවක සංඛ්‍යාවක් ලෙස සලකනු ලැබේ.

06.5 එහෙත් I/ I ශ්‍රේණියේ තනතුරු නාමයන් මත පත්වීමක් ලබා දිය යුත්තේ 1 උපලේඛනයේ සඳහන් 1/1 ශ්‍රේණියේ තනතුරු සහ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් සේවයේ අවශ්‍යතාවය මත අනුමත කරන ලද තනතුරු සඳහා පමණි.

06.6 සාමාන්‍යයෙන් බඳවා ගැනීම් සිදුකරනුයේ 3- III ,2- II හා 1 - III ශ්‍රේණිවලටය. එහෙත් අභ්‍යන්තර උසස් වීම් මගින් පුරප්පාඩු පිරවිය නොහැකි අවස්ථාවන්හිදී සේවා අවශ්‍යතාව අනුව 1 පන්තියේ අනෙකුත් ශ්‍රේණි සඳහා පත්වීම් බලධරයා විසින් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බාහිරව බඳවා ගැනීම් සිදු කරනු ලැබිය හැකිය.

07. වැටුප් පරිමාණ හා කාර්යක්ෂමතා කඩඉම් :

07.1 අදාළ වන වැටුප් පරිමාණ පහත සඳහන් පරිදිවේ.

**(අ) විධායක මට්ටම** SL – 1 – 2006

රු.22,935 – 10 x645 – 08x 790 - 17 x 1050 - රු 53,555/=

| පන්තිය | වැටුප් පරිමාණය |
|---|---|
| 1 පන්තිය I ශ්‍රේණිය | රු.36,755 – 17 x 1050 – 53,555/= |
| 1 පන්තිය II ශ්‍රේණිය | රු.30,175 – 08x 790 – 36,495/= |
| 1 පන්තිය III ශ්‍රේණිය | රු.22,935 – 10 x645 – 29,385/= |

**(ආ) තෘතීය මට්ටම** **MN – 6 – 2006 – A**

රු.17,680 – 10 x320 – 11x 365 - 15 x 450 – රු 31,645/=

| පන්තිය | වැටුප් පරිමාණය |
|---|---|
| 2 පන්තිය I ශ්‍රේණිය | රු.21,245 – 10 x365 – 15x 450 – 31,645/= |
| 2 පන්තිය II ශ්‍රේණිය | රු.17,680 – 10 x320 – 20,880/= |

(ඇ) ද්වීතීය මට්ටම MT – 1 – 2006 – A

රු.14,425 – 10 x145 – 11x 170 - 6 x 240 – 14 x320 – රු 23,665/=

| පන්තිය | වැටුප් පරිමාණය |
|---|---|
| 3 පන්තිය Iශ්‍රේණිය | රු.17,985 – 05x240 – 14x 320 – 23,665/= |
| 3 පන්තිය II ශ්‍රේණිය | රු.16,045 – 10 x170 – 17,745/= |
| 3 පන්තිය III ශ්‍රේණිය | රු.14,425 – 10 x145 – 15,875/= |

7.2 1 පන්තිය I,II ,III ශ්‍රේණි ,2 පන්තියේ II ශ්‍රේණිය සහ 3 පන්තියේ III ශ්‍රේණිය සඳහා බාහිරව බඳවා ගන්නා නිලධාරීන් පත්වීම් දින සිට වසර 03 ක් ඉකුත් වීමට පෙර 1 වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය. මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සේවය ස්ථිර කිරීම සඳහා අනිවාර්ය අවශ්‍යතාවයක් වේ. ( විෂය නිර්දේශය හා ලකුණු පරිපාටි පිළිවෙලින් 7,6 හා 5 උප ලේඛනයන්හි දැක්වේ.)

7.3 3 පන්තිය 11 ශ්‍රේණියේ වසර 07 ක් ඇතුළත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත් විය යුතුය.( විෂය නිර්දේශය හා ලකුණු පරිපාටිය 8 උප ලේඛනයන්හි දැක්වේ.)

7.4 2 පන්තිය 1 ශ්‍රේණියේ වසර 03 ක් ඇතුළත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත් විය යුතුය.( විෂය නිර්දේශය හා ලකුණු පරිපාටිය 9 උප ලේඛනයන්හි දැක්වේ.)

7.5 1 පන්තිය III ශ්‍රේණියේ වසර 10 ක් ඇතුළත පරිගණක / තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබාගත යුතුය.

7.6 සියළුම නිලධාරීන් පත්වීම් දින සිට වසර 05 ක් ඉකුත් වීමට පෙර සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ නියමිත මට්ටමේ ප්‍රවීනතාවක් ලබාගත යුතුය.

08. බඳවා ගැනීමේ පරිපාටිය :

08.1 3 පන්තියේ III ශ්‍රේණිය

8.1.1 සුදුසුකම්

(අ) බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුළඅවම වශයෙන් අවුරුදු 03 ක ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ආ) ඉල්ලුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

(ඇ) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

(ඈ) බස්නාහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැදී සිටිය යුතුය.

(ඉ) අධ්‍යාපන සුදුසුකම් :

භාෂාව , ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව ඇතුළු සම්මාන 05 ක් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයක් (06) සමත් වී තිබීම.එකවර විෂයන් පහක් (05) සමත්ව තිබීම අනිවාර්යය වේ.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විෂයයන් 03ක් එකවර සමත් වීම.

(ඊ) වෘත්තීය සුදුසුකම් :

තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක පරිගණක සාක්ෂරතාවය පිළිබඳ පහත සඳහන් විෂය සංරචකයන්ගෙන් යුත් පැය 720 කට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

1. පරිගණක භාවිතයෙන් සම්මත මෙහෙයුම් පද්ධතිය යටතේ ලිපි ගොනු කළමනාකරණය ;
2. පරිගණක වදන් සැකසුම;
3. පැතුරුම්පත් සකස් කිරීම හා භාවිතා කිරීම;
4. පරිගණක භාවිතයෙන් ඉදිරිපත් කිරීම;
5. දත්ත සමුදාය නිර්මාණය හා භාවිතය;
6. අන්තර්ජාලය හා ඉලෙක්ට්‍රොනික තැපැල භාවිතයේ හැකියාව.



...කාරතුමා විසින් අනුමත කරන ලදී. 14/250. දිනය : 2013/10/24

### 8.1.2 බඳවා ගැනීමේ ක්‍රමය

[illegible]හිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ හෝ පුවත්පතක පළකරන ලද [illegible]වීමක් මගින් ඉල්ලුම්පත් කැඳවා පත්වීම් බලධරයා වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ [illegible] බලධාරියා විසින් හෝ පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් [illegible] හෝ පවත්වනු ලබන විවෘත තරග විභාගයක ප්‍රතිඵල මත සුදුසුකම් සපුරාලන අය අතුරින් තෝරා ගනු [illegible].(විෂය නිර්දේශය හා ලකුණු පරිපාටිය 2 උප ලේඛනයේ දැක්වේ.)

8.1.3 මෙම ශ්‍රේණියට නව බඳවා ගැනීම පත්වීම් බලධරයා විසින් පුරප්පාඩු සංඛ්‍යාව හා සේවා අවශ්‍යතාවය පදනම් කොට කළ යුතුය.

## 8.2 3 පන්තියේ II ශ්‍රේණියට උසස් කිරීම.

### 8.2.1 සුවිශේෂී කාර්යය සාධනය යටතේ උසස් කිරීම

#### 8.2.1.1 සුදුසුකම්

(අ) නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීම.

(ආ) පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක හා සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(ඇ) අනුමත කාර්ය සාධනය ඇගයීමේ ක්‍රියා පරිපාටිය මත සාමාන්‍ය මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් තිබීම.

#### 8.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :

පත්වීම් බලධරයා වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ පත්වීම් බලධාරියා විසින් හෝ පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් හෝ පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයක ප්‍රතිඵල මත විභාගය සමත් වූ දින හෝ වසර හයක් (06) සේවා කාලය සම්පූර්ණ කරණු ලබන දින යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට 3-II ශ්‍රේණියට උසස් කරනු ලැබේ. .(විෂය නිර්දේශය හා ලකුණු පටිපාටිය 10 උප ලේඛනයේ දැක්වේ.)

### 8.2.2 සාමාන්‍ය කාර්ය සාධනය යටතේ උසස් කිරීම

#### 8.2.2.1 සුදුසුකම්

(අ) නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීම.

(ආ) 3- III ශ්‍රේණියේ වසර දහයක (10) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම, එයින් උසස් වීම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් තිබීම.

(ඇ) අනුමත කාර්ය සාධන ඇගයීමේ ක්‍රියා පටිපාටිය මත සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනයක් තිබීම.

(ඈ)ඉහත 8.2.1.2 හි සඳහන් යෝග්‍යතා පරික්ෂණයෙන් සමත් විය යුතුය.

#### 8.2.2.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් පරික්ෂා කිරීමෙන් අනතුරුව ඉහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් 3- II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.



...රු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද
...ය : 1/1/4/2/20 දිනය : 2013/10/24

## 8.3 3 පන්තියේ 1 ශ්‍රේණියට උසස් කිරීම.

### 8.3.1 සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම

#### 8.3.1.1 සුදුසුකම්

(අ) 3 පන්තියේ 11 ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.
(ආ) 3-11 ශ්‍රේණියේ වසර අටක (08) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම
(ඇ) අනුමත කාර්ය සාධනය ඇගයීමේ ක්‍රියා පරිපාටිය මත සාමාන්‍ය මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් තිබීම
(ඈ) අවම වශයෙන් ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) 5 වෙනි මට්ටම හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඒ හා සමාන වෙනත් සුදුසුකමක් ලබා තිබීම.

#### 8.3.1.2 උසස් කිරීමේ ක්‍රමය

සම්මුඛ පරීක්ෂණයක් මඟින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරු ව ඉහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් 3 - 1 ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

### 8.3.2 සාමාන්‍ය කාර්ය සාධනය යටතේ උසස් කිරීම

#### 8.3.2.1 සුදුසුකම්

(අ). 3 පන්තියේ II ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.
(ආ).3 පන්තියේ II ශ්‍රේණියෙහි වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම, එයින් උසස්වීම් ලබන දිනට පූර්වාසන්න වසර පහක සතුටුදායක සේවා කාලයක් තිබීම.
(ඇ). ඉහත 8.3.1.1 හි (ඈ) හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

#### 8.3.2.2 උසස් කිරීමේ ක්‍රමය

සම්මුඛ පරීක්ෂණයක් මඟින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරු ව ඉහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් 3 - 1 ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

## 8.4 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීම / උසස් කිරීම.

### 8.4.1 බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්

(අ). බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුළ අවම වශයෙන් අවුරුදු 03 ක ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
(ආ). ඉල්ලුම් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට වයස අවුරුදු 20 ට නො අඩු විය යුතු අතර, අවුරුදු 30 ට නො වැඩි විය යුතු ය.
(ඇ). යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
(ඈ). බස්නාහිර පළාතේ ඕනෑ ම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.
(ඉ). අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :-

(1). පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණ විද්‍යාව විෂයයක් සහිත ව උපාධියක් ලබා තිබීම සහ පරිගණක ක්ෂේත්‍රයේ අවුරුදු 03 ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.
හෝ
(2). පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක්
සහ
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.
සහ
පරිගණක ක්ෂේත්‍රයේ අවුරුදු 02 ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.



... ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
දිනය : 2013/09/24

හෝ

(3). අවම වශයෙන් තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තිය යෝග්‍යතා (NVQ) 7 වෙනි මට්ටම හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඒ හා සමාන වෙනත් සුදුසුකමක් සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ අවුරුදු 3ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**8.4.2 අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

3 පන්තියේ I ශ්‍රේණියේ වසර 4 ක සේවා කාලයක් සමඟ පූර්වාසන්න වසර 5 ක සතුටුදායක හා සක්‍රිය සේවා කාලයක් තිබීම.

**8.4.3 බඳවා ගැනීමේ / උසස් කිරීමේ ක්‍රමය**

පත්වීම් බලධාරියා වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ පත්වීම් බලධාරියා හෝ පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් හෝ පවත්වනු ලබන විවෘත තරග විභාගයක ප්‍රතිඵල මත 2 පන්තියේ - II ශ්‍රේණියට බඳවා ගනු / උසස් කරනු ලැබේ. (විෂය නිර්දේශය හා ලකුණු පරිපාටිය 3 උපලේඛනයේ දැක්වේ.)

පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 60% ක් අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන්ද 40%ක් බාහිර අයදුම්කරුවන්ගෙන්ද පුරවනු ලැබේ. සම්පූර්ණ 60% ක පුරප්පාඩු සංඛ්‍යාව අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් පිරවීමට නොහැකි අවස්ථාවලදී ඉතිරිවන පුරප්පාඩු සංඛ්‍යාව බාහිර අයදුම්කරුවන්ගෙන් පුරවනු ලැබේ.

## 8.5 2 පන්තියේ I ශ්‍රේණියට උසස් කිරීම.

### 8.5.1 සුවිශේෂි කාර්ය සාධනය යටතේ උසස් කිරීම.

**8.5.1.1 සුදුසුකම්**

(අ) නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී තිබීම.
(ආ) 2 පන්තියේ II ශ්‍රේණියේ පූර්වාසන්න වසර 05ක සතුටුදායක හා සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
(ඇ) අනුමත කාර්ය සාධන ඇගයීමේ ක්‍රියා පටිපාටිය මත සාමාන්‍ය මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් තිබීම.

**8.5.1.2 උසස් කිරීමේ ක්‍රමය.**

පත්වීම් බලධාරියා වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ පත්වීම් බලධාරියා විසින් හෝ පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් හෝ පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයක ප්‍රතිඵල මත විභාගය සමත් වූ දින හෝ වසර 06 ක සේවා කාලය සම්පූර්ණ කරනු ලබන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට 2-I ශ්‍රේණියට උසස් කරනු ලැබේ. (විෂය නිර්දේශය හා ලකුණු පටිපාටිය 11 උපලේඛනයේ දැක්වේ.)

### 8.5.2 සාමාන්‍ය කාර්ය සාධනය යටතේ උසස් කිරීම.

**8.5.2.1 සුදුසුකම්**

(අ) නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.
(ආ) 2-II ශ්‍රේණියෙහි වසර 10ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම, එයින් උසස්වීම් ලබන දිනට පූර්වාසන්න වසර පහක සතුටුදායක සේවා කාලයක් තිබීම.
(ඇ) අනුමත කාර්ය සාධන ඇගයීමේ ක්‍රියාපටිපාටිය මත සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනයක් තිබීම.
(ඈ) ඉහත 8.5.1.2 හි සඳහන් යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්විය යුතුය.

8.5.2.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් 2-I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

## 8.6 1 පන්තියේ III ශ්‍රේණියට බඳවාගැනීම / උසස් කිරීම

### 8.6.1 බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්

(අ) බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුළ අවම වශයෙන් අවුරුදු 03 ක ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ආ) ඉල්ලුම්පත්‍ර භාරගැනීමේ අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

(ඇ) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(ඈ) බස්නාහිර පළාත් ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

(ඉ) අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද -

1. පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණ විද්‍යාව /පරිගණක ඉංජිනේරු විද්‍යාව හෝ පරිගණක තාක්ෂණයට අදාල විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන උපාධියක් ලබා තිබීම

   හෝ

2. පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් (මෙහිදී සම්පූර්ණ උපාධියෙන් අවම වශයෙන් 1/3 කොටසක් මෙම විෂය ක්ෂේත්‍රය පිළිබඳව විය යුතුය.)

   සහ

   විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම සහ පරිගණක ක්ෂේත්‍රයේ අවුරුදු 03 ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම

   හෝ

3. තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) 7 වෙනි මට්ටම හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඒ හා සමාන වෙනත් සුදුසුකම් සමග තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ අවුරුදු 5 ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

### 8.6.2 අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්

(අ) 2 පන්තියේ I ශ්‍රේණියේ වසර 5 ක සතුටුදායක හා සක්‍රීය සේවා කාලයක් තිබීම.

(ආ) එම ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම.

(ඇ) අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමා බලනොපානු ඇත.

(ඈ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

### 8.6.3 බඳවා ගැනීමේ /උසස් කිරීමේ ක්‍රමය

පත්වීම් බලධාරියා වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ පත්වීම් බලධාරියා හෝ පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් හෝ පවත්වනු ලබන විවෘත තරග විභාගයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කරනු ලැබේ.
(විෂය නිර්දේශය හා ලකුණු පටිපාටිය 4 උපලේඛනයේ දැක්වේ.)



...කාරතුමා විසින් අනුමත කරන ලදී.
.../250. දිනය :- 2013/10/24

## 8.7 1 පන්තියේ II ශ්‍රේණියට උසස් කිරීම/බඳවා ගැනීම

### 8.7.1 සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම

#### 8.7.1.1 සුදුසුකම්

(අ) නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

(ආ) පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

(ඇ) 1 පන්තියේ III ශ්‍රේණියේ වසර 06 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ උසස්වීම ලබන දිනට පූර්වාසන්නයෙන් වූ වසර පහක සතුටුදායක සේවා කාලයක් තිබීම.

#### 8.7.1.2 උසස් කිරීමේ ක්‍රමය

පත්වීම් බලධාරියා වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් හෝ පවත්වනු ලබන තරග විභාගයක ප්‍රතිඵල මත විභාගය සමත්වූ දින හෝ වසර 06 ක සේවා කාලය සම්පූර්ණ කරනු ලබන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට 1 - II ශ්‍රේණියට උසස් කරනු ලැබේ. (විෂය නිර්දේශය හා ලකුණු පටිපාටිය 12 උපලේඛනයේ දැක්වේ.)

### 8.7.2 සාමාන්‍ය කාර්ය සාධනය යටතේ උසස් කිරීම

#### 8.7.2.1 සුදුසුකම්

(අ) නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

(ආ) 1 - III ශ්‍රේණියෙහි වසර 10 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම, එයින් උසස්වීම් ලබන දිනට පූර්වාසන්න වසර පහක සතුටුදායක සේවා කාලයක් තිබීම.

(ඇ) අනුමත කාර්ය සාධන ඇගයීමේ ක්‍රියා පටිපාටිය මත සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනයක් තිබීම.

#### 8.7.2.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් 1-11 ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

## ව්‍යතිරේඛය

### 1. බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්

(අ) බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුළ අවම වශයෙන් අවුරුදු 03 ක ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ආ) ඉල්ලුම්පත්‍ර භාරගැනීමේ අවසාන දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.

(ඇ) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(ඈ) බස්නාහිර පළාත් ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

(ඉ) බඳවාගනු ලබන තනතුරට නියමිත කාර්ය භාරය අයත් වන විෂය ක්ෂේත්‍රයෙහි නියම කරනු ලබන විශේෂ සුදුසුකම් ලබා තිබිය යුතුය.

(ඊ) අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද –

1. පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණ විද්‍යාව හෝ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම

   හෝ

   තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) 7 වෙනි මට්ටම හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඒ හා සමාන වෙනත් සුදුසුකමක් ලබා තිබීම

   සහ

2. පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම

   සහ

3. පරිගණක ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 6 ක පළපුරුද්ද ලබා තිබිය යුතුය. (එම වසර 6 න් වසර 2 ක් පශ්චාත් උපාධිය ලැබීමෙන් පසුව විය යුතුය.)

**2. බඳවා ගැනීමේ ක්‍රමය**

සේවයේ අවශ්‍යතාවය අනුව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත 1 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

8.8 1 පන්තියේ I ශ්‍රේණියට බඳවා ගැනීම/උසස් කිරීම

**8.8.1 සුදුසුකම්**

(අ) 1 පන්තියේ II ශ්‍රේණියේ වසර 07 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ උසස්වීම ලබන දිනට පූර්වාසන්න වසර පහක සතුටුදායක සේවා කාලයක් තිබීම.

**8.8.2 උසස් කිරීමේ ක්‍රමය**

(අ) බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව 1 පන්තියේ 1 ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

**ව්‍යතිරේඛය**

**1. බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

(අ) බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුළ අවම වශයෙන් අවුරුදු 03 ක ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ආ) ඉල්ලුම්පත්‍ර භාරගැනීමේ අවසාන දිනට උපරිම වයස සීමාව අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

(ඇ) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(ඈ) බස්නාහිර පළාත් ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

(ඉ) බඳවාගනු ලබන තනතුරට නියමිත කාර්ය භාරය අයත්වන විෂය ක්ෂේත්‍රයෙහි නියම කරනු ලබන විශේෂ සුදුසුකම් ලබා තිබිය යුතුය.

(ඊ) අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද -

පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණ විද්‍යාව හෝ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම

සහ

පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම

සහ

විධායක මට්ටමේ තනතුරක වසර 12 ක පළපුරුද්දක් ලබා තිබීම. (වසර 12 න් වසර 3 ක් පශ්චාත් උපාධිය ලැබුවාට පසු විය යුතුය.)

**2. බඳවා ගැනීමේ ක්‍රමය**

(අ) බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව 1 පන්තියේ I ශ්‍රේණියට බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

## 09. තනතුරෙහි ස්ථිර කිරීම

9.1 බාහිරව බඳවාගනු ලබන නිලධාරීන් වසර 3ක පරිවාස කාලයකට යටත් වේ. 7.2 ඡේදයේ දක්වෙන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව, පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම්, නිලධාරියා පරිවාස කාලය අවසානයේදී බස්නාහිර පළාත් රාජ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ ස්ථිර කරනු ලැබේ.

9.2 අභ්‍යන්තර උසස් කිරීම් මගින් බඳවා ගන්නා නිලධාරීන් ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ 11.3 වගන්තිය යටතේ නිශ්චිත වැඩ බැලීමේ කාල සීමාවකට යටත්වන අතර, එම වැඩ බැලීමේ කාලය තුළ සිය රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම්, වැඩ බැලීමේ කාලය අවසානයේදී බස්නාහිර පළාත් රාජ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ ස්ථිර කරනු ලැබේ.



...ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී. ...දිනය : 2013/10/24

## 10. අන්තර්ග්‍රහණය කිරීම.

10.1 නිශ්චිත වශයෙන්ම පරිගණක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයට අදාළ තනතුරු සහ දැනට එම තනතුරු සඳහා විධිමත්ව බඳවාගෙන ඇති නිලධාරීන් පහත දක්වා ඇති විධි විධාන යටතේ බස්නාහිර පළාත් රාජ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

10.1.1. අන්තර්ග්‍රහණය කිරීමට මනාපය පළ කරනු ලබන්නන් ආයතන ප්‍රධානියා මගින් මෙම ව්‍යවස්ථාවේ පළමු පරිශිෂ්ඨයේ දැක්වෙන ආකෘති පත්‍රයට අනුව අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

10.1.2 ආයතන ප්‍රධානියා විසින් තමා වෙත ලැබෙන අයදුම්පත් මෙම ව්‍යවස්ථා ප්‍රකාශයට පත් කිරීමෙන් මසක් ඇතුළත බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවිය යුතුය.

10.1.3 බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ඉල්ලා සිටිනු ලබන වෙනත් අවශ්‍ය ලිපි ලේඛන හෝ විස්තර සැපයීමට ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතුය.

10.1.4 අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන්ට විධිමත් පත්වීමේ ලිපියක් අදාළ වන පරිදි බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කිරීමට කටයුතු කරනු ඇත.

10.1.5 අන්තර්ග්‍රහණයෙන් පසුව ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4 වන වගන්තිය ප්‍රකාරව වැටුප තීරණය කරනු ලැබේ.

10.1.6 මූලික වශයෙන් දැනට දරන තනතුර, දැනට ලබන වැටුප, රාජකාරි ස්වභාවය සහ වගකීම දැනට දරන තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටියෙහි ඉල්ලා ඇති අවම අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම්, ඉල්ලුම්කරු විසින් ලබා ඇති අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් යනාදි කරුණු මත පදනම්ව අන්තර්ග්‍රහණය සිදු කරන බැවින් අයදුම්පත්‍රයේ අදාළ කරුණු නිවැරදිව සඳහන් කිරීම අයදුම්කරුවන්ගේ සහ ආයතන ප්‍රධානීන්ගේ වගකීම වේ.

## 11. අන්තර්කාලීන විධිවිධාන

11.1 දැනට සේවයේ සිටින නිලධාරීන් සම්බන්ධයෙන් මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි විධිවිධාන අදාල වීමට ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනයේ සිට වසර 03 ක සහන කාලයක් දෙනු ලැබේ. එම කාලය තුළ ඔවුන් විසින් නව සේවා ව්‍යවස්ථාවේ ඇතුළත් කර ඇති සුදුසුකම් සපුරා ගත යුතුය.

11.2 බස්නාහිර පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ නොකරන විශ්‍රාම වැටුප් සහිත පත්වීමකට හිමිකම් ලැබූ නිලධාරීන්ට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයෙහි 2 වන හා 7 වන වගන්ති යටතේ දැක්වෙන වරප්‍රසාද හිමිවේ. ඔවුහු නව සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාප නොවෙත් නම්, ඒ බවට ප්‍රකාශයක් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් නව ව්‍යවස්ථාව බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන දිනයේ සිට මාස 06 ක් ඉකුත් වන දිනට පෙර පත්වීම් බලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව නිලධාරියා එම ප්‍රකාශය කළ දිනය ද අවසන් වරට සේවයට වාර්තා කළ දිනය ද යන දින දෙකෙන් පසුව එළඹෙන දිනය දක්වා ඔහු හෝ ඇය කලින් සිටි සේවාවේ දිගටම රැඳී සිටියා සේ සලකා ලැබිය යුතු වැටුප් වර්ධක ද සමඟ අවසන් දිනට ලැබිය හැකියැයි උපකල්පනය කරන වැටුප මත විශ්‍රාම ගන්වනු ඇත. බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් නව ව්‍යවස්ථාව අනුමත කරන දිනයෙන්, මාස 06 ක් ඉක්මවන දිනයේ සිට ඉහත කී ක්‍රියාමාර්ගය වලංගු නොවේ. යම් හෙයකින් සිය මනාපය මාස 06 ක් තුළ ප්‍රකාශ කර නොමැති නම් එම නිලධාරියා අනිවාර්ය විශ්‍රාම ගැන්වීමකට යටත් වනු ඇත.

## 12. ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා නොමැති කරුණු

මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා තීරණය කරනු ඇත.

1 වන උපලේඛනය

## බස්නාහිර පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයට ඇතුළත්වන තනතුරු නාම ලේඛනය

### 1 පංතියේ තනතුරු

(අ) 1 පංතියේ I ශ්‍රේණියේ තනතුරු

| තනතුරු නාමය | තනතුර අයත් ආයතනය | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| .................................. | ......................................... | තනතුරු අනුමතව නැත. |

(ආ) 1 පංතියේ II ශ්‍රේණියේ තනතුරු

| තනතුරු නාමය | තනතුර අයත් ආයතනය | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| .................................. | ......................................... | තනතුරු අනුමතව නැත. |

(ඇ) 1 පංතියේ III ශ්‍රේණියේ තනතුරු

| තනතුරු නාමය | තනතුර අයත් ආයතනය | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| .................................. | ......................................... | තනතුරු අනුමතව නැත. |

### 2 පන්තියේ තනතුරු

(අ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි I ශ්‍රේණිය
(ආ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි II ශ්‍රේණිය

### 3 පන්තියේ තනතුරු

(අ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර I ශ්‍රේණිය
(ආ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර II ශ්‍රේණිය
(ඇ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර III ශ්‍රේණිය

**දෙවන පන්තියේ සහ තුන්වන පන්තියේ තනතුරු සංඛ්‍යාව අන්තර්ග්‍රහණය කටයුතු වලින් පසුව ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.**

116

93

2 වන උපලේඛනය

**බස්නාහිර පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය**

(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 8.1.2 ඡේදය බලන්න.)

1. මෙම සේවයට තෝරා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය පත්වීම් බලධාරියා වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ පත්වීම් බලධාරියා විසින් හෝ පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් හෝ පවත්වනු ලැබේ.

2. විභාගයः

(1) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.
(11) සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටින අපේක්ෂකයින්ට අවශ්‍ය වන්නේ නම් එම භාෂා මාධ්‍ය සමග ඉංග්‍රීසි භාෂාවද භාවිතා කළ හැකිය.

3. විභාග විෂයය සහ ඒ ඒ විෂයයට වෙන් කෙරෙන ලද ලකුණු පහත දැක්වේ. නොපැහැදිලි අත්අකුරු සහ අක්ෂර වින්‍යාසයේ වැරදි සඳහා ලකුණු අඩු කරනු ලැබේ.
විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| | | ලකුණු | කාලය |
|---|---|---|---|
| (1) | **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ලිඛිත පරීක්ෂණය** | 100 | පැය 2 |
| (11) | **අභියෝග්‍යතා පරීක්ෂණය** | 100 | පැය 1 |
| | **මුළු ලකුණු** | 200 | |

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පරීක්ෂණයः**

විභාග අපේක්ෂකයාගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳව සාමාන්‍ය දැනුම පරීක්ෂා කරනු ලබන ප්‍රශ්න, මෙම ප්‍රශ්න පත්‍රයට ඇතුළත් වේ. එයට ලිඛිත ප්‍රශ්න මෙන්ම බහුවරණ ප්‍රශ්න ද අඩංගු විය හැකිය. මෙහෙයුම් පද්ධතීන්, මෘදුකාංග, දෘඩාංග, වදන් සැකසුම, පැතුරුම්පත්, දත්ත සමුදාය කළමනාකරණය, අන්තර්ජාලය සහ ඉලෙක්ට්‍රොනික තැපැල ආදි ක්ෂේත්‍ර වලින් විභාග අපේක්ෂකයා පරීක්ෂණයට භාජනයට කරනු ලැබේ.

**අභියෝග්‍යතාවः**

අපේක්ෂකයාගේ සංඛ්‍යා ලේඛණාත්මක හැකියාව, තර්කානුකූල කරුණු දැක්වීම සහ සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්න මෙම ප්‍රශ්න පත්‍රයට අඩංගුවේ.

සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයෙකුගේ යෝග්‍යතාව සහ හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් වී ඇත. මෙම විභාගය තරඟ විභාගයක් වුවද එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණු වලින් යටත් පිරිසෙයින් සියයට 40 ක් වත් අපේක්ෂකයා විසින් ලබාගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට 50 ක් වත් ලබා ගත යුතුවේ. තරඟ විභාගය සඳහා වෙන්කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි, ලබාගත් ලකුණු අනුපිළිවෙල අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

4. මෙම රෙගුලාසි සහ විධිවිධාන අවශ්‍යතාවය අනුව සංශෝධනය කළ හැක. විභාගය පිළිබඳ සම්පූර්ණ විස්තර සහ විභාග විෂය නිර්දේශ පත්‍රය ගැන දැන ගැනීම සඳහා වරින්වර බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රසිද්ධ කරන චක්‍රලේඛ, පුවත්පත් දැන්වීම් හෝ ගැසට් නිවේදන කෙරෙහි විභාග අපේක්ෂකයන් සැලකිල්ල යොමු කළ යුතුය.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
... අංකය : 1/4/4/250 දිනය : 2013/10/24

**බස්නාහිර පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය**

(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 8.4.3 ඡේදය බලන්න.)

1. මෙම සේවයට තෝරා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය පත්වීම් නිලධාරියා වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ පත්වීම් බලධාරියා විසින් හෝ පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් හෝ පවත්වනු ලැබේ.

2. විභාගය:

(1) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

(11) සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටින අපේක්ෂකයින්ට අවශ්‍ය වන්නේ නම් එම භාෂා මාධ්‍ය සමඟ ඉංග්‍රීසි භාෂාවද භාවිතා කළ හැකිය.

3. විභාග විෂයය සහ ඒ ඒ විෂයයට වෙන් කරන ලද ලකුණු පහත දැක්වේ. නොපැහැදිලි අත්අකුරු සහ අක්ෂර වින්‍යාසයේ වැරදි සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| | | ලකුණු | කාලය |
|---|---|---|---|
| (1) | **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ** | | |
| | **ලිඛිත පරීක්ෂණය** | 100 | පැය 2 |
| (11) | **අභියෝග්‍යතා පරීක්ෂණය** | 100 | පැය 1 |
| | **මුළු ලකුණු** | 200 | |

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පරීක්ෂණය:**

විභාග අපේක්ෂකයාගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳව සාමාන්‍ය දැනුම සමඟ අධීක්ෂණ හැකියාව පරීක්ෂා කරනු ලබන ප්‍රශ්න, මෙම ප්‍රශ්න පත්‍රයට ඇතුළත් වේ. එයට ලිඛිත ප්‍රශ්න මෙන්ම බහුවරණ ප්‍රශ්න ද අඩංගු විය හැක. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මූලධර්ම, පරිගණක වාස්තු විද්‍යාව හා මෙහෙයුම් පද්ධතීන්, මෘදුකාංග, දෘඩාංග, දත්ත සන්නිවේදනය හා පරිගණක ජාල, වදන් සැකසුම, පැතුරුම්පත්, දත්ත සමුදා කළමනාකරණය, අන්තර්ජාලය වෙබ් අඩවි නිර්මාණය හා නව අන්තර්ජාල සේවාවන්, කාර්යාල භාවිත මෘදුකාංග පැකේජ, ඉලෙක්ට්‍රොනික් තැපැල, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති ජීව චක්‍රය ආදි ක්ෂේත්‍ර වලින් විභාග අපේක්ෂකයා පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

**අභියෝග්‍යතාව:**

අපේක්ෂකයාගේ සංඛ්‍යා ලේඛණාත්මක හැකියාව, තර්කානුකූල කරුණු දැක්වීම සහ සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්න මෙම ප්‍රශ්න පත්‍රයට අඩංගුවේ.

සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයෙකුගේ යෝග්‍යතාව සහ හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් වී ඇත. මෙම විභාගය තරඟ විභාගයක් වුවද එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණු වලින් යටත් පිරිසෙයින් සියයට 40 ක් වත් අපේක්ෂකයා විසින් ලබාගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට 50 ක් වත් ලබා ගත යුතුවේ. තරඟ විභාගය සඳහා වෙන්කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි, ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

4. මෙම රෙගුලාසි සහ විධිවිධාන අවශ්‍යතාවය අනුව සංශෝධනය කළ හැක. විභාගය පිළිබඳ සම්පූර්ණ විස්තර සහ විභාග විෂය නිර්දේශ පත්‍රය ගැන දැන ගැනීම සඳහා වරින්වර බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රසිද්ධ කරන ගැසට් නිවේදන, පුවත්පත් නිවේදන කෙරෙහි විභාග අපේක්ෂකයන් සැළකිල්ල යොමු කළ යුතුය.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී. 2013/10/24

117

91

4 වන උපලේඛනය

**බස්නාහිර පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I පන්තියේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය**

(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 8.6..3 ඡේදය බලන්න)

1. මෙම සේවයට තෝරා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය පත්වීම් බලධාරියා වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ පත්වීම් බලධාරියා විසින් හෝ පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් හෝ පවත්වනු ලැබේ.

2. පරීක්ෂණය කිරීමේ ක්‍රමය

(I) පහත සඳහන් විෂයයන්ගෙන් ලිඛිත පරීක්ෂණයකි.

| | කාලය | ලකුණු |
|---|---|---|
| (අ) සාමාන්‍ය බුද්ධිය | පැය 1 යි | 100 |
| (ආ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවබෝධය | පැය 2 යි | 100 |
| (ඇ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණ සඳහා අභියෝග්‍යතාව | පැය 2 යි | 100 |
| **මුළු ලකුණු** | | **300** |

වාචික පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබීම සඳහා සියලුම අපේක්ෂකයන් විසින් සියලුම ප්‍රශ්නපත්‍රවලට පිළිතුරු සපයා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් සියයට 40 ක් වත් ලකුණු ලබා ගත යුතුය.

(ii) ව්‍යුහගත වාචික පරීක්ෂණය. ලකුණු 100 යි.

ලිඛිත පරීක්ෂණයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතුරින් සුදුසුකම් ලැබූවන් වාචික පරීක්ෂණයට කැඳවනු ලැබේ. එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40% ක් වත් ලකුණු ලබා ගන්නා වූද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රමාණවත් බවට නියම කරනු ලබන ඉහළ මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා වූද, අපේක්ෂයන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ඇත. ඉහත සුදුසුකම් ලබන අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටී නම් පුරප්පාඩු සංඛාව මෙන් දෙගුණයක් වන අපේක්ෂකයන් සංඛ්‍යාවක් වාචික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණු සංඛ්‍යාව වාචික පරීක්ෂණ මණ්ඩලයට ලබා දෙනු නොලැබේ.
(ලකුණු ලබා දීමේ ක්‍රමය පත්වීම් බලධාරියා/රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගැනීමේ මුල් අවස්ථාවේ දී අනුමත කරනු ලැබේ.)

3. වරක දී පත්කරනු ලබන සංඛ්‍යාව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් තීරණය කරනු ලැබේ.

4. විෂය නිර්දේශය

(i). ලිඛිත පරීක්ෂණය

(අ) සාමාන්‍ය බුද්ධිය (කාලය පැය 1 යි. ලකුණු 100 යි)

පදගත සංඛ්‍යාත්මක සහ රූපාකාර සංදර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් සහ ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය සහ බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ.

(ආ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවබෝධය (කාලය පැය 2 යි. ලකුණු 100 යි)
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණයේ පරිකල්පන හැකියාවන්, තොරතුරු තාක්ෂණ ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව, තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති කළමනාකරණ



ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී. ... අංකය ...4/4/4/250 දිනය ...2023/10/09

හැකියාව, සහ දෙන ලද මාතෘකාවන්/තේමාවන් සඳහා පද්ධති විශ්ලේෂණය, සැලසුම්කරණය හා මෘදුකාංග පද්ධති වර්ධනය පිළිබඳ අපේක්ෂකයාගේ ශක්තිය මෙහි දී පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

(ඇ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණය සඳහා අභියෝග්‍යතාව -
(කාලය පැය 2 යි. ලකුණු 100 යි)

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ නව ප්‍රවණතා සහිතව, මෘදුකාංග සංවර්ධනය පිළිබඳ සියලුම අංගයන් සම්බන්ධයෙන් මනා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණය සඳහා අයදුම්කරුගේ අභියෝග්‍යතාව මැනීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත.

(ii).ව්‍යුහගත වාචික පරීක්ෂණය (ලකුණු 100 යි)

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සමන්විත, අපක්ෂපාති මණ්ඩලයක් විසින්, පළාත් රාජ්‍ය සේවයේ රැකියාවකට අපේක්ෂකයාගේ පෞද්ගලික යෝග්‍යතාව පරීක්ෂාකර බැලීම ව්‍යුහගත වාචික පරීක්ෂණයේ අරමුණ වේ. අපේක්ෂකයෙකුගේ මානසික ගති ලක්ෂණ නිගමනය කිරීම මෙම පරීක්ෂණයේ තවත් අරමුණකි. පුළුල් වශයෙන් ගතහොත් මෙය අපේක්ෂකයාගේ බුද්ධිමය තත්ත්වය පමණක් නොව සමාජ ගති ලක්ෂණ සහ දේශීය වශයෙන් සහ අන්තර්ජාතික වශයෙන් පවත්නා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වර්ධනයන් කෙරෙහි අපේක්ෂකයාගේ ඇති උනන්දුව ද මැනීමකි. තීරණය කළ යුතු වන සමහර ගති ලක්ෂණ අතර මානසික සාවධාන බව, සමාග්‍රහණ ශක්තීන්, පැහැදිළි සහ තර්කානුකූල අදහස් ඉදිරිපත් කිරීම, තීරණය කිරීමේ තුල්‍යභාවය, ලැදියාවේ විවිධත්වය සහ ගැඹුරු බව, සමාජ සංසක්තිය සහ නායකත්වය සඳහා හැකියාව, බුද්ධිමය සහ සදාචාරාත්මක අවංකකම වේ.

5. මෙම රෙගුලාසි සහ විධිවිධාන අවශ්‍යතාවය අනුව සංශෝධනය කළ හැක. විභාගය පිළිබඳ සම්පූර්ණ විස්තර සහ විභාගවිෂය නිර්දේශ පත්‍රය ගැන දැන ගැනීම සඳහා වරින් වර බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රසිද්ධ කරන ගැසට් නිවේදන කෙරෙහි විභාග අපේක්ෂකයන් සැළකිල්ල යොමු කළ යුතුය



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
...නය : 1/4/4/250 දිනය : 2013/10/24

118

89

5 වන උපලේඛනය

**බස්නාහිර පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 7.2 ඡේදය බලන්න.)

1. මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පත්වීම් බලධාරියා වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ පත්වීම් බලධාරියා විසින් හෝ පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් හෝ පවත්වනු ලැබේ.

2. අදාළ සේවයට ඇතුළත්වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් නිලධාරීන් විසින් ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතුවේ. තරඟ විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධරයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතුවේ.

3. නිලධාරීන්ට තම කැමැත්ත පරිදි එක් එක් විෂය සඳහා වෙන වෙනම වාරවලදී විභාගයට පෙනී සිටීමට හැකිවේ. එසේකුදු වුවත් සාමාර්ථය සඳහා එක් එක් විෂයට නියමිත මුළු ලකුණු වලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ලබාගත යුතුවේ.

4. **සුදුසුකම්:**

3 පන්තියේ III ශ්‍රේණියේ නිලධාරීහු මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබති.

5. විභාගය විෂය පහත දැක්වෙන පරිදිවේ.

| | විෂය | ලකුණු | කාලය |
|---|---|---|---|
| (1) | ආයතන සංග්‍රහය | 100 | පැය 1 |
| (11) | මුදල් රෙගුලාසි | 100 | පැය 1 |
| | මුළු ලකුණු | 200 | |

**ආයතන සංග්‍රහය**

ආයතන සංග්‍රහයේ විධිවිධාන සම්බන්ධයෙන් රජයේ නිලධාරියා සතු මූලික දැනුම පරීක්ෂා කිරීම මෙහි අපේක්ෂාව වේ.

**මුදල් රෙගුලාසි**

රජයේ කාර්යාලවල භාවිත වන මුදල් රෙගුලාසි පිළිබඳව මූලික දැනුම හා මුදල් පාලන පෙත්වල කාර්ය පිළිබඳ අවබෝධය හා ගබඩාකරණය පිළිබඳ මූලික දැනුම මැනීම අපේක්ෂා කෙරේ.

6. මෙම රෙගුලාසි සහ විධිවිධාන අවශ්‍යතාවය අනුව සංශෝධනය කළ හැක. විභාගය පිළිබඳ සම්පූර්ණ විස්තර සහ විභාග විෂය නිර්දේශ පත්‍රය ගැන දැන ගැනීම සඳහා වරින්වර බස්නාහිර පළාත් රාජ්‍ය කොමිෂන් සභාව විසින් ප්‍රසිද්ධ කරන චක්‍රලේඛ, පුවත්පත් දැන්වීම් හා ගැසට් නිවේදන කෙරෙහි විභාග අපේක්ෂකයන් සැලකිල්ල යොමු කළ යුතුය.



...අධිකාරතුමා විසින් අනුමත කරන ලදී. ...//4/25 ... දිනය 2013/10/24

**බස්නාහිර පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 7.2 ඡේදය බලන්න.)

1. මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පත්වීම් බලධාරියා වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ පත්වීම් බලධාරියා විසින් හෝ පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් හෝ පවත්වනු ලැබේ.

2. අදාළ සේවයට ඇතුළත්වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් නිලධාරීන් විසින් ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතුවේ. තරඟ විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධරයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතුවේ.

3. නිලධාරීන්ට තම කැමැත්ත පරිදි එක් එක් විෂය සඳහා වෙන වෙනම වාරවලදී විභාගයට පෙනී සිටීමට හැකිවේ. එතෙකුදු වුවත් සාමාර්ථය සඳහා එක් එක් විෂයට නියමිත මුළු ලකුණු වලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ලබාගත යුතුවේ.

4. **සුදුසුකම්:**

2 පන්තියේ II ශ්‍රේණියේ නිලධාරිහු මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබති.

5. විභාගය විෂය පහත දැක්වෙන පරිදිවේ.

| | විෂය | ලකුණු | කාලය |
|---|---|---|---|
| (1) | ආයතන සංග්‍රහය | 100 | පැය 2 |
| (11) | මුදල් රෙගුලාසි | 100 | පැය 2 |
| | මුළු ලකුණු | 200 | |

**ආයතන සංග්‍රහය**

ආයතන සංග්‍රහයේ විධිවිධාන සම්බන්ධයෙන් නිලධාරියා සතු සාමාන්‍ය දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාව පරීක්ෂා කෙරේ. ආයතන සංග්‍රහයේ 1 වැනි 11 වැනි වෙලුමෙහි අඩංගු පරිච්ඡේද වලින් මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ.

**මුදල් රෙගුලාසි**

රජයේ කාර්යාලවල භාවිත වන මුදල් රෙගුලාසි පිළිබඳව දැනුම හා මුදල් පාලන පෙත්වල කාර්ය පිළිබඳව අවබෝධය හා ගබඩාකරණය පිළිබඳ දැනුම මැනීම අපේක්ෂා කෙරේ.

6. මෙම රෙගුලාසි සහ විධිවිධාන අවශ්‍යතාවය අනුව සංශෝධනය කළ හැක. විභාගය පිළිබඳ සම්පූර්ණ විස්තර සහ විභාග විෂය නිර්දේශ පත්‍රය ගැන දැන ගැනීම සඳහා වරින්වර බස්නාහිර පළාත් රාජ්‍ය කොමිෂන් සභාව විසින් ප්‍රසිද්ධ කරන චක්‍රලේඛන, පුවත්පත් දැන්වීම් හා ගැසට් නිවේදන කෙරෙහි විභාග අපේක්ෂකයන් සැළකිල්ල යොමු කළ යුතුය.



...රු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
...ංකය : 1/1/4/2/52 දිනය : 2013/12/24

119 87

## 7 වැනි උපලේඛනය

**බස්නාහිර පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III/II/I ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 7.2 ඡේදය බලන්න)

1. මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පත්වීම් බලධාරියා වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ පත්වීම් බලධාරියා විසින් හෝ පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් හෝ පවත්වනු ලැබේ.

2. කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත.

    (1) ආයතන සංග්‍රහය හා පරිපාලනය,
    (2) මුදල් රෙගුලාසි හා රාජ්‍ය අංශයෙ මූල්‍ය කළමනාකරණය,
    (3) කළමනාකරණය හා සංවිධානය,
    (4) ඉ-රාජ්‍ය සංකල්පය හා තොරතුරු තාක්ෂණ කළමනාකරණය.

යම් නිලධාරියෙකුට මෙම විභාගයට නියමිත විෂයයන් සඳහා එකම අවස්ථාවකදී හෝ වෙන් වෙන් අවස්ථාවලදී හෝ පෙනී සිටීමට හැකිය. සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම නියමිත කාලය පැය තුනක් වන අතර නියමිත ලකුණු ගණන 100 කි. සමත්වීම සඳහා එක් එක් විෂයයෙන් අවම වශයෙන් 40%ක් ලකුණු ලබාගත යුතුය.

3. විභාග පරිපාටිය

(1) ආයතන සංග්‍රහය හා පරිපාලනය :- පහත දැක්වෙන කරුණු මත පදනම් වන එක් ප්‍රශ්න පත්‍රයකි.

(i). කාර්යාල හා ක්ෂේත්‍ර කටයුතු සංවිධානය කිරීම හා සංවිධාන ක්‍රම,
(ii). ආයතන සංග්‍රහයේ පහත දැක්වෙන පරිච්ඡේද,
I, II, III, V, VI,VII, IX, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII,XLVII සහ XLVIII

සටහන : අපේක්ෂකයෙකු 40%ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

(2) මුදල් රෙගුලාසි හා රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය. - පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයකි.

(අ) ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලනය,
රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ ව්‍යවස්ථාමය විධිවිධාන,
රාජ්‍ය මූල්‍ය සම්බන්ධ පාර්ලිමේන්තුවේ පාලනය,
අරමුදල් යන්නෙහි අර්ථය,
ඒකාබද්ධ අරමුදල සහ එහි ක්‍රියාකාරිත්වය,
විසර්ජනයේ අරමුණ හා විසර්ජන ක්‍රම,
අවිනිශ්චිත අවස්ථා අරමුදල,
වෙනත් අරමුදල් හා ඒවායේ ක්‍රියාකාරිත්වය,
රාජ්‍ය ආදායම,
මුදල් ඇමතිවරයාගේ බලතල හා කාර්ය භාරය,
භාණ්ඩාගාරයේ බලතල හා කාර්ය භාරය,
වොරන්ට් සහ අග්‍රිම අදිකාරිය,
විගණකාධිපති, ඔහුගේ බලතල හා කාර්ය භාරය,
රාජ්‍ය වියදම් කමිටුව,
රාජ්‍ය ව්‍යාපාර කමිටුව.

(ආ) ගිණුම් නිලධාරීන්, ප්‍රධාන ගිණුම් නිලධාරීන් හා රාජ්‍ය ආදායම පිළිබඳ ගිණුම් නිලධාරීන් පත්කිරීම,ඔවුන්ගේ බලතල හා කාර්යභාරය

(ඇ) අභ්‍යන්තර විගණනය

(ඈ) රාජ්‍ය වියදම් සැලසුම් කිරීම හා කළමනාකරණය,

සංවිධානවල අරමුණු හා කාර්යභාරයන් හඳුනාගැනීම,
රාජ්‍ය ප්‍රතිපත්ති, පරමාර්ථ, ඉලක්ක හා වැඩසටහන් හඳුනාගැනීම,
සංවර්ධන ව්‍යාපෘති, වැඩසටහන් සැලසුම් කිරීම හා ඇගයීම් හා ප්‍රමුඛතාකරණය,



...තුමා විසින් අනුමත කරන ලදී
දිනය : 2013/10/24

වාර්ෂික ආදායම් හා වියදම් ඇස්තමේන්තු සැකසීම හා අවසන් තීරණ ගැනීම.

(ඉ) අනුමත වියදම් ඇස්තමේන්තුවල වෙනස්කම් කිරීම,

වීරමොං පරිපාටිය ක්‍රියාත්මක කිරීම,
රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා හා වැටුප් කළමනාකරණය,
මුළු පිරිවැය ඇස්තමේන්තු හා ඒවා ප්‍රතිශෝධනය කිරීම,
පරිපූරක ඇස්තමේන්තු.

(ඊ) රජයේ දේපලවල පාඩු හා අත්හැරීම්

(උ) විවිධ ගිණුම් කටයුතු

(ඌ) මූල්‍ය කළමනාකරණය සඳහා කාර්ය භාරයන් පැවරීම

(එ) රජයේ මුදල්වල භාරකාරත්වය හා බැංකු ගිණුම් පරිපාටිය

(ඒ) රජයේ සැපයුම් ක්‍රියාපරිපාටිය,

භාණ්ඩ, සේවා හා වැඩ ලබාගැනීම,
ප්‍රසම්පාදන මණ්ඩල හා තාක්ෂණික ඇගයුම් කමිටුවල සංයුතිය,
පත්කිරීම් බලතල හා කාර්ය භාරය,
ප්‍රසම්පාදන ඇගයීමේ ක්‍රියාපරිපාටිය,
විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල කළමනාකරණය.

(3) කළමනාකරණය හා සංවිධානය. - පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයකි.

(අ) කළමනාකරණය හා සංවිධානය පිළිබඳ මූලධර්ම,
(ආ) එම මූලධර්ම රාජ්‍ය අංශයේ පැන නගින ගැටළු හා ප්‍රශ්නවලට අදාළ කරගැනීම,
(ඇ) කළමනාකරණය පිළිබඳ නූතන ක්‍රමවේදයන් හා ශිල්පක්‍රම.

(4) ඉ-රාජ්‍ය සංකල්පය හා තොරතුරු තාක්ෂණ කළමනාකරණය,

ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු |
|---|---|---|
| I වැනි ප්‍රශ්න පත්‍රය -බහුවරණ | පැය 1 යි | 40 |
| II වැනි ප්‍රශ්න පත්‍රය - රචනාමය | පැය 2 යි | 60 |
| **මුළු ලකුණු** | | 100 |

(අ) ඉ-රාජ්‍ය ක්‍රමයේ විකාශනය, එහි අවධි, ඉ-රාජ්‍ය මූලික කොටස්, ඉ-සේවා හා ඉ-රාජ්‍ය ව්‍යාපෘති, රාජ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපරිව්‍යුහය, ඉ-රාජ්‍ය සාර්ථක කර ගැනීමේ තීරණාත්මක සාධක, ඉ-රාජ්‍ය කළමනාකරණය, අන්තර් ක්‍රියාකාරී හැකියාව (Interoperability) හා සේවා අභිමුඛ නිර්මිතය (shService Oriented Architecture) ඉ-රාජ්‍ය සංකල්පවලට ඇතුළත් වේ.

(ආ) තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති ජීව චක්‍රය, එහි එක් එක් අවස්ථාවල වැදගත්කම හා ඒ සඳහා අවශ්‍ය සම්පත්වල විශේෂතා, තොරතුරු තාක්ෂණ කළමනාකරණයේ මූලික සිද්ධාන්ත, තොරතුරු තාක්ෂණ සම්පත් කළමනාකරණය, තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතිවල අවදානම් සහ ඒවා අවම කර ගැනීම තොරතුරු තාක්ෂණ කළමනාකරණයට ඇතුළත් වේ.

4. මෙම රෙගුලාසි සහ විධිවිධාන අවශ්‍යතාවය අනුව සංශෝධනය කළ හැක. විභාගය පිළිබඳ සම්පූර්ණ විස්තර සහ විභාග විෂය නිර්දේශ පත්‍රය ගැන දැන ගැනීම සඳහා වරින් වර බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රසිද්ධ කරන ගැසට් නිවේදන කෙරෙහි විභාග අපේක්ෂකයන් සැළකිල්ල යොමු කළ යුතුය.

8 වන උපලේඛනය

**බස්නාහිර පළාත් රාජ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ II ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 7.4 ඡේදය බලන්න.)

1. මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පත්වීම් බලධාරියා වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ පත්වීම් බලධාරියා විසින් හෝ පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් හෝ පවත්වනු ලැබේ.
2. නිලධාරීන් විසින් තමන් සේවයට බැඳීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් නිලධාරීන් විසින් ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතුවේ. තරඟ විභාගයට පෙනී නොසිට සේවයට බැඳුණු නිලධරයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතුවේ.

3. නිලධාරීන්ට තම කැමැත්ත පරිදි එක් එක් විෂය සඳහා වෙන් වෙන් අවස්ථාවලදී විභාගයට පෙනී සිටීමට හැකිවේ. එසේවුවද වුවත් සාමාර්ථය සඳහා එක් එක් විෂයට නියමිත මුළු ලකුණු වලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ලබාගත යුතුවේ.

4. සේවයේ 3 පන්තියේ II ශ්‍රේණියේ නිලධාරීන්ට මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇත.

5. **විභාග පටිපාටිය:**

අපේක්ෂකයන් විසින් පහත සඳහන් ඇතුළත් ලිඛිත විභාගයකට පෙනී සිටිය යුතුය.

| | විෂය | ලකුණු | කාලය |
|---|---|---|---|
| (1) | කාර්යාල ක්‍රම සහ කාර්ය පටිපාටිය | 100 | පැය 2 |
| (11) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ | | |
| | ලිඛිත පරීක්ෂණය | 100 | පැය 3 |
| | මුළු ලකුණු | 200 | |

**කාර්යාල ක්‍රම සහ කාර්ය පටිපාටිය**

රජයේ කාර්යාලයන්හි භාවිතා කෙරෙන කාර්යාල ක්‍රම පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කිරීම සහ ඒවා භාවිතා කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම ද අපේක්ෂා කෙරේ.

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ලිඛිත පරීක්ෂණය**

රජයේ කාර්යාලයන්හි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සාමාන්‍ය සංකල්ප සහ තොරතුරු තාක්ෂණය මනාසේ උපයෝගී කර ගැනීම පිළිබඳව දැනුම මෙමගින් පරීක්ෂා කෙරේ.

ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.

| | විෂයය | ලකුණු | කාලය |
|---|---|---|---|
| (i) | I වැනි ප්‍රශ්න පත්‍රය - බහුවරණ | 40 | පැය 1 |
| (ii) | II වැනි ප්‍රශ්න පත්‍රය - රචනාමය | 60 | පැය 2 |
| | මුළු ලකුණු | 100 | |

රජයේ ආයතනයන් හි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත වන ආකාරය, පරිගණක ජාල සහ දත්ත සන්නිවේදනය පිළිබඳ මනා දැනුම, පොදු කාර්ය මෘදුකාංග පිළිබඳ දැනුම සහ විශේෂිත භාවිත මෘදුකාංග, දත්ත සුරැකුම් පිළිබඳ සහ මෘදුකාංගවල සුරක්ෂිතභාවය සහ පරිගණක පද්ධතිවල අඛණ්ඩ සේවාව ලබා ගැනීම හා දත්ත සුරක්ෂිතභාවය වර්ධනය සඳහා ගත හැකි මූලික ක්‍රියාමාර්ග.

6. මෙම රෙගුලාසි සහ විධිවිධාන අවශ්‍යතාව අනුව සංශෝධනය කළ හැකි ය. විභාගය පිළිබඳ සම්පූර්ණ විස්තර සහ විභාග විෂයය නිර්දේශ පත්‍ර ගැන දැන ගැනීම සඳහා වරින් වර බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රසිද්ධ කරන චක්‍රලේඛ, පුවත්පත් දැන්වීම් හා ගැසට් නිවේදන කෙරෙහි විභාග අපේක්ෂකයන් සැලකිල්ල යොමු කළ යුතුය.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද
අංකය : 1/4/4/250 දිනය : 2013/10/24

## බස්නාහිර පළාත් රාජ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 ශ්‍රේණියේ I ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 7.4 ඡේදය බලන්න.)

1. මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පත්වීම් බලධාරියා වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ පත්වීම් බලධාරියා විසින් හෝ පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මඟින් හෝ පවත්වනු ලැබේ.

2. නිලධාරීන් විසින් තමන් සේවයට බැඳීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් නිලධාරීන් විසින් ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතු වේ. තරග විභාගයක් නොමැති ව සේවය බැඳුණු නිලධරයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතු වේ.

3. නිලධාරීන් තම කැමැත්ත පරිදි එක් එක් විෂයය සඳහා වෙන් වෙන අවස්ථාවල දී විභාගයට පෙනී සිටීමට හැකි වේ. එසේකුදු වුවත් සමාර්ථය සඳහා එක් එක් විෂයයට වෙන්ව මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ලබා ගත යුතු වේ.

4. **විභාග පටිපාටිය :**

අපේක්ෂකයන් විසින් පහත සඳහන් විෂයයන් ඇතුළත් ලිඛිත විභාගයකට පෙනී සිටිය යුතු ය.

| | විෂයය | ලකුණු | කාලය |
|---|---|---|---|
| (i) | කාර්යාල ක්‍රම සහ කාර්ය පටිපාටිය | 100 | පැය 2 |
| (ii) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා ඉ-රාජ්‍ය | 100 | පැය 3 |
| | **මුළු ලකුණු** | 200 | |

කාර්යාල ක්‍රම සහ කාර්ය පටිපාටිය

රජයේ කාර්යාලයන් හි භාවිත කෙරෙන කාර්යාල ක්‍රම පිළිබඳ ව අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කිරීම සහ ඒවා භාවිත කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම අපේක්ෂා කෙරේ.

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා ඉ-රාජ්‍ය :**

ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.

| | විෂයය | ලකුණු | කාලය |
|---|---|---|---|
| (i) | I වැනි ප්‍රශ්න පත්‍රය - බහුවරණ | 40 | පැය 1 |
| (ii) | II වැනි ප්‍රශ්න පත්‍රය - රචනාමය | 60 | පැය 2 |
| | **මුළු ලකුණු** | 100 | |

(අ). තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති ජීව චක්‍රයේ මූලික කොටස් වන ශක්‍යතා අධ්‍යයනය, පද්ධති විශ්ලේෂණය, පද්ධති නිර්මාණය, ඒ සඳහා මෘදුකාංග සංවර්ධනය, ඒවා ස්ථාපනය, පරිශීලන භාර ගැනීම් පරීක්ෂා ආදිය ද ඒවාට අදාළ වන තාක්ෂණික ක්ෂේත්‍ර වන ඇල්ගොරිදම්, HTML, XTML, php, දත්ත හා තොරතුරු ආරක්ෂාව, ව්‍යසන හේතුවෙන් කඩාවැටුණු පද්ධති ස්ථාපනය, බුද්ධිමය දේපල හිමිකම හා මෘදුකාංග බලපත්‍ර, නිදහස් හා විවෘත මූලාශ්‍ර මෘදුකාංග, වෙබ් 2.0 ආදිය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කොටසට ඇතුළත් වේ.

(ආ). තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය රාජ්‍ය අංශයට යොදා ගැනීමේ ප්‍රතිලාභ, රාජ්‍ය සේවා තොරතුරු සන්නිවේදන තාක්ෂණය යොදා ගෙන වඩා කාර්යක්ෂම ව සැපයීම, ඉ-රාජ්‍ය ක්‍රම සඳහා මූලිකා තාක්ෂණික අවශ්‍යතා, රාජ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපරි ව්‍යුහයක මූලික අංග, ඉ-රාජ්‍ය පද්ධතියක මූලික අංග, අන්තර් ක්‍රියාකාරී හැකියාව (Interoperability) ආදිය ඉ-රාජ්‍ය කොටසට අයත් වේ.

6. මෙම රෙගුලාසි සහ විධිවිධාන අවශ්‍යතාව අනුව සංශෝධනය කළ හැකි ය. විභාගය පිළිබඳ සම්පූර්ණ විස්තර සහ විභාග නිර්දේශ පත්‍රය ගැන දැන ගැනීම සඳහා වරින් වර බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රසිද්ධ කරන චක්‍රලේඛ, පුවත්පත් දැන්වීම් හා ගැසට් නිවේදන කෙරෙහි විභාග අපේක්ෂකයන් සැලකිල්ල යොමු කළ යුතු ය.



...ආණ්ඩුකාරතුමා විසින් ... කරන ලදී. 2013/10/24

10 වන උපලේඛනය

**බස්නාහිර පළාත් රාජ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ II ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන යෝග්‍යතා පරීක්ෂණය**

(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 8.2.1.2 ඡේදය බලන්න.)

1. මෙම යෝග්‍යතා පරීක්ෂණය පත්වීම් බලධාරියා වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පත්වීම් බලධාරියා විසින් හෝ පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මඟින් හෝ පවත්වනු ලැබේ.

2. විභාග විෂයය සහ ඒ ඒ විෂයයට වෙන් කරන ලද ලකුණු පහත දක්වේ. අපැහැදිලි අකුරු සඳහා හා අක්ෂර වින්‍යාසයේ වැරදි සඳහා ලකුණු අඩු කරනු ලැබේ. කියවිය නො හැකි අත් අකුරින් ලියා ඇති අපේක්ෂකයින් නුසුදුස්සන් බවට පත්වීමට ඉඩ ඇත.

| විෂයය | ලකුණු | කාලය |
|---|---|---|
| සාමාන්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 100 | පැය 3 |
| මූල්‍ය පද්ධති | 100 | පැය 2 |
| **මුළු ලකුණු** | 200 | |

සාමාන්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.

| | ප්‍රශ්න පත්‍රය | ලකුණු | කාලය |
|---|---|---|---|
| (i) | I වැනි ප්‍රශ්න පත්‍රය - බහුවරණ | 40 | පැය 1 |
| (ii) | II වැනි ප්‍රශ්න පත්‍රය - රචනාමය | 60 | පැය 2 |
| | මුළු ලකුණු | 100 | |

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ මූලික සංකල්ප සහ රාජ්‍ය ආයතන තුළ ඒවා ප්‍රායෝගික භාවිතය පිළිබඳ දැනුම මෙම ප්‍රශ්න පත්‍රයෙන් පරීක්ෂා කර බලනු ලැබේ. දෘඩාංග සහ මෘදුකාංග පිළිබඳ මනා දැනුම, කාර්යාල භාවිත මෘදුකාංගයන් උපයෝගී කිරීමේ හැකියාව, පද්ධති විශ්ලේෂණය සහ පද්ධති නිර්මාණය පිළිබඳ මූලික කරුණු සහ දත්ත සන්නිවේදනයේ මූලික කරුණු මෙයට අයත් වේ.

මූල්‍ය පද්ධති :-

මෙම ප්‍රශ්න පත්‍රය පහත සඳහන් ආකාරයෙන් වේ.

I වෙනි කොටස - අමාත්‍යාංශවල සහ රජයේ දෙපාර්තමේන්තුවල මූල්‍ය සැපයීම් පාලනය, ආදායම් සහ වියදම්, අයවැය ලේඛන ඇස්තමේන්තු, සැපයීමේ සහ සේවාවන් පිළිබඳ දැනුම පරීක්ෂා කර බැලීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත. (ලකුණු - 50)

II වෙනි කොටස - ගබඩා හරි වැරදි බැලීම සහ ගබඩාකරණය (ලකුණු - 50)

ගණක යන්ත්‍ර භාවිත කිරීමට අපේක්ෂකයන්ට ඉඩ දෙනු නො ලැබේ.

සටහන :-

(i). සේවයට ඇතුළු වීම සඳහා තරග විභාගයට තමා පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් ම අපේක්ෂකයින් මෙම ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලිවිය යුතු ය. තරග විභාගයක් නැතිව බඳවාගෙන ඇති නිලධාරීන් තමන් සේවාවට ඇතුළුවීමට සුදුසුකම් ලැබූ භාෂා මාධ්‍යයෙන් ම මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලබා ගත යුතු ය.

(ii). මෙම විභාගය සමත්වීම සඳහා එක් එක් විෂයයන් අඩු ම වශයෙන් ලකුණු සියයට 33 ක් ද, විෂයය තුනට ම නියමිත ලකුණු සංඛ්‍යාවේ එකතුවේ සාමාන්‍යයෙන් 40% ක් ද, එම විභාගයේ දී අපේක්ෂකයින් විසින් ලබා ගත යුතු ය.

මෙම රෙගුලාසි සහ විධිවිධාන අවශ්‍යතාව අනුව සංශෝධනය කළ හැකි ය. විභාගය පිළිබඳ සම්පූර්ණ විස්තර සහ විභාග විෂයය නිර්දේශ පත්‍රය ගැන දැන ගැනීම සඳහා වරින් වර බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රසිද්ධ කරන ගැසට් නිවේදන හා චක්‍රලේඛ කෙරෙහි විභාග අපේක්ෂකයින් සැලකිල්ල යොමු කළ යුතු ය.



...ධිකාරතුමා විසින් අනුමත කරන ලදී. ...14/250. දිනය 2013/10/24

## බස්නාහිර පළාත් රාජ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය 2 පන්තියේ I ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන යෝග්‍යතා පරීක්ෂණය

(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 8.5.1.2 ඡේදය බලන්න.)

1. මෙම යෝග්‍යතා පරීක්ෂණය පත්වීම් බලධාරියා වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පත්වීම් බලධාරියා විසින් හෝ පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මඟින් හෝ පවත්වනු ලැබේ.

2. **විභාග පටිපාටිය :**

විභාග විෂයයන් සහ ඒ ඒ විෂයයට වෙන් කරන ලද ලකුණු පහත දක්වේ.

(i). පහත සඳහන් විෂයයන් ඇතුළත් වන ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයට අපේක්ෂකයන් පෙනී සිටිය යුතු ය.

| විෂයය | ලකුණු | කාලය |
|---|---|---|
| ආයතන කාර්ය පටිපාටිය | 100 | පැය 1 1/2 යි |
| රාජ්‍ය මුදල් කළමනාකරණය | 100 | පැය 1 1/2 යි |
| සිද්ධි අධ්‍යයනය | 100 | පැය 1 |
| සාමාන්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 100 | පැය 3 |
| **මුළු ලකුණු** | 400 | |

(ii). **විභාග විෂයයන් :**

**ආයතන කාර්ය පටිපාටිය**

ආයතන සංග්‍රහයේ 1 සහ 11 බාණ්ඩවල අඩංගු කරුණු සම්බන්ධ ව අපේක්ෂකයාගේ ප්‍රායෝගික දැනුම පරීක්ෂා කර බැලීම අපේක්ෂා කරනු ලැබේ.

**රාජ්‍ය මුදල් කළමනාකරණය**

මූල්‍ය විගණනය පිළිබඳ ව ප්‍රායෝගික දැනුම
විගණන පද්ධති පිළිබඳ මූලික දැනුම
ගබඩාකරණය පිළිබඳ මූලික දැනුම
ටෙන්ඩර් පටිපාටිය පිළිබඳ මූලික දැනුම

**සිද්ධි අධ්‍යයනය**

කාර්යාල ස්වයංකරණයට අදාළ වන ගැටලුවකට ගත යුතු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්‍රියාමාර්ග විභාග වන පරිදි බහුවරණ / රචනාමය ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සැපයිය යුතු වේ.

සාමාන්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රශ්න පත්‍රය
මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.

| | ප්‍රශ්න පත්‍රය | ලකුණු | කාලය |
|---|---|---|---|
| (i) | I වැනි ප්‍රශ්න පත්‍රය - බහුවරණ | 40 | පැය 1 |
| (ii) | II වැනි ප්‍රශ්න පත්‍රය - රචනාමය | 60 | පැය 2 |
| | **මුළු ලකුණු** | 100 | |

අධීක්ෂණ කාර්යයන් සහිත, අයදුම්කරුවන් විසින් ඉටු කරනු ලැබීමට අපේක්ෂා කරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුම පිළිබඳ පරීක්ෂා කර බැලීම අපේක්ෂා කෙරේ.

ඉහත සඳහන් ප්‍රශ්නපත්‍ර දෙකට දත්ත පාද කළමනාකරණය, වෙබ් තාක්ෂණය ඇල්ගොරිතම්ස් සහ පරිගණක වැඩසටහන් සම්පාදනය, ප්‍රාදේශීය හා පුළුල් පරිගණක ජාල, ජාල තාක්ෂණය හා දත්ත සන්නිවේදනය, මෘදුකාංග හා මෘදුකාංග බලපත්‍ර, නිදහස් හා විවෘත මූලාශ්‍ර මෘදුකාංග, දත්තා හා තොරතුරු ආරක්ෂණය, පද්ධති විශ්ලේෂණය හා පද්ධති නිර්මාණය යන තාක්ෂණ ක්ෂේත්‍රයන් අඩංගු වනු ඇත.

1. විභාගයට පෙනී සිටිය යුතු මාධ්‍යය :- ලිඛිත පරීක්ෂණය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පැවැත්වෙනු ඇත. අපේක්ෂකයන් තමන් සේවයට පත්වීමේ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් ම මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවිය යුතු ය. තරග විභාගයක් නොමැති ව සේවයට බඳවාගෙන ඇති අයට සේවයට ඇතුළුවීමට සුදුසුකම් ලැබූ භාෂා මාධ්‍යයෙන් ම පිළිතුරු සැපයිය හැකි ය.

2. මෙම රෙගුලාසි සහ විධිවිධාන අවශ්‍යතාව අනුව සංශෝධනය කළ හැකි ය. විභාගය පිළිබඳ සම්පූර්ණ විස්තර සහ විභාග විෂය නිර්දේශ පත්‍රය ගැන දැන ගැනීම සඳහා වරින් වර බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රසිද්ධ කරන චක්‍රලේඛන, පුවත්පත් දැන්වීම් හා ගැසට් නිවේදන කෙරෙහි විභාග අපේක්ෂකයන් සැලකිල්ල යොමු කළ යුතු ය.

**බස්නාහිර පළාත් රාජ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ II ශ්‍රේණියට උසස් කිරීම සඳහාවන යෝග්‍යතා පරීක්ෂණය**

(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 8.7.1.2 ඡේදය බලන්න)

1. මෙම යෝග්‍යතා පරීක්ෂණය පත්වීම් බලධාරියා වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ පත්වීම් බලධාරියා විසින් හෝ පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් හෝ පවත්වනු ලැබේ.

2. විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් යුක්ත වේ.

(i) තොරතුරු තාක්ෂණ සිද්ධි අධ්‍යයනය
(ii) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රවණතා කළමනාකරණය.

3. විභාග පරිපාටිය :

(i) තොරතුරු තාක්ෂණ සිද්ධි අධ්‍යයනය - කාලය පැය 3 යි

අපේක්ෂකයන්ගේ තර්කානුකූල හේතු විග්‍රහය, නිර්මාණාත්මක භාවය, ගැටලු විශ්ලේෂණය සහ වඩා හොඳ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විසඳුම් සැපයීමේ හැකියාව සහ සෛද්ධාන්තික දැනුම ප්‍රයෝගිකව උපයෝගී කර ගැනීම පිළිබඳ අවබෝධය පරීක්ෂා කර බැලීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති කළමනාකරණය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපදේශනය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රවණතා සහ ඉ-රාජ්‍ය පාලන ක්ෂේත්‍රයට අදාළ වඩා සංකීර්ණ සිද්ධි එකක් හෝ වැඩි ගණනක් පිළිබඳ ප්‍රශ්න කීපයකට පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ.

සිද්ධි අධ්‍යයන දෙකක් සඳහා පිළිතුරු සැපයිය යුතුවේ.

සටහන :- සුදුසුකම් ලැබීමට නම් අපේක්ෂකයෙකු විසින් අවම වශයෙන් ලකුණු 50%ක් ලබාගත යුතුවේ.

(ii) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රවණතා - කාලය පැය 3 යි

මෙම ප්‍රශ්න පත්‍රය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ, විසඳීම් ක්ෂේත්‍රයන්හි වැදගත් සිද්ධීන්, සංවර්ධනය වෙමින් පවත්නා රටවල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවර්ධනය, ඉ-රාජ්‍ය පාලනයේ සංකල්ප, වෙනස්වීම් කළමනාකරණය, රාජ්‍ය ක්‍රියාදාම ප්‍රතිනිර්මාණය, ඉ-රාජ්‍ය පාලනයේ යෝග්‍යතම පරිචයන්, ඉ-රාජ්‍ය පාලනයේ සාර්ථක සහ අසාර්ථක සාධක සහ ලෝකයේ මෙන්ම ප්‍රාදේශීය වශයෙන් ද රාජ්‍ය අංශයෙහි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික ව්‍යාපෘති කළමනාකරණය සම්බන්ධයෙන් සකස් වූ ප්‍රශ්න ගණනාවකින් යුක්ත වේ. මෙම විෂයයන් පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කර බලනු ලැබේ.

සටහන :- සුදුසුකම් ලැබීමට නම් අපේක්ෂකයා විසින් අවම ලකුණු 50%ක් ලබාගත යුතු වේ.

4. මෙම රෙගුලාසි සහ විධිවිධාන අවශ්‍යතාවය අනුව සංශෝධනය කළ හැක. විභාගය පිළිබඳ සම්පූර්ණ විස්තර සහ විභාග විෂය නිර්දේශ පත්‍රය ගැන දැන ගැනීම සඳහා වරින් වර බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රසිද්ධ කරන ගැසට් නිවේදන කෙරෙහි විභාග අපේක්ෂකයන් සැළකිල්ල යොමු කළ යුතුය.



අනුමත කරන ලදී
දිනය 2013/10/24

පරිශිෂ්ඨය 1

# බස්නාහිර පළාත් රාජ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය.

## අන්තර්ග්‍රහණය සඳහා ඉල්ලුම්පත්‍රය.

A 4 ප්‍රමාණයේ එකම කොලයේ දෙපැත්තම භාවිතා කරන්න.

**1 කොටස -අයදුම්කරු විසින් සම්පූර්ණ කල යුතුය.**

1. සේවා ස්ථානයේ නම සහ ලිපිනය - ------------------------------------------------------------
------------------------------------------------------------------------------------------
------------------------------------------------------------------------------------------
--------------------------------------------------------------------------------

2. අයදුම්කරුගේ සම්පූර්ණ නම - ------------------------------------------------------------
------------------------------------------------------------------------------------------

3. උපන් දිනය- ----------------------------------------

4. රා.ප.ව. 6/2006 අනුව වැටුප් පරිමාණය හා දැනට ලබන වැටුප් පියවර - ------------------------------
------------------------------------------------------------------------------------------
--

5. අයදුම්කරු විසින් ලබා ඇති උසස්ම සුදුසුකම -

(අ) අධ්‍යාපන - අ.පො.ස. ( සා.පෙල) ------------------------------------------------------------
-----

------------------------------------------------------------ ---------------

------------------------------------------------------------ ---------------

------------------------------------------------------------ ---------------

අ.පො.ස. (උසස් පෙල) ------------------------------------------------------------
-

------------------------------------------------------------ ---------------

------------------------------------------------------------ ---------------

------------------------------------------------------------ ---------------

------------------------------------------------------------ ---------------

වෙනත් ------------------------------------------------------------

------------------------------------------------------------ ---------------



... ආණ්ඩුකාරතුමා විසින අනුමත කරන ලදී. අංකය : 1/1/4/250 දිනය : 2013/10/24

(ආ) වෘත්තිය සුදුසුකම් -

6. දැනට සිටින තනතුරට බඳවා ගනු ලැබූ බඳවා ගැනීමේ පරිපාටිය අනුව නියම කර ඇති කාර්යක්ෂමතා

කඩඉම් විභාග සමත් වූ දිනයන්.

**කාර්යක්ෂමතා කඩඉම් විභාගය.** **සමත් වූ දිනය**

1. ---------------------------------- ----------------------
2. ---------------------------------- ----------------------
3. ---------------------------------- ----------------------

4. සේවා කාලය පිලිබඳ විස්තරය

| සිට | දක්වා | තනතුර | සේවා ස්ථානය | සේවා කාලය ( අවුරුදු) |
|---|---|---|---|---|
| | | | | |

5. ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

දිනය -

අයදුම්කරුගේ අත්සන -

2 කොටස - ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කල යුතුය

අයදුම්කරු විසින් ඉහත 1-8 දක්වා සඳහන් කර ඇති තොරතුරු නිවැරදිය. ඔහු/ ඇය මෙම වැටුප් ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි/ නොකරමි. ( නිර්දේශ නොකරන්නේ නම් හේතු සඳහන් කල යුතුය.)

දිනය -...........................

..........................................................

ආයතන ප්‍රධානියගේ අත්සන හා නිල මුද්‍රාව

3 කොටස -බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රයෝජනය සඳහා.

1 අයදුම්කරු/ අයදුම්කාරිය මෙම සේවයට අන්තර්ග්‍රහණය කරමි/නොකරමි.

2 අන්තර්ග්‍රහණය නොකරන්නේ නම් ඊට හේතු -

..........................................................................................

..........................................................................................

3 අන්තර්ග්‍රහණය කරනු ලබන පන්තිය -

..........................................................................................

දිනය - ...............................

ලේකම්

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)